# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1920/38 - 2015 ජුනි මස 26 වැනි සිකුරාදා - 2015.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : සීඑස්ඒ/1/2/3.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මේ ප්‍රකාශනයෙන් -

(අ) අද දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි, පාර්ලිමේන්තුව විසුරුවා හරින අතර, අභිනව පාර්ලිමේන්තුව වර්ෂ දෙදහස් පහළොවක් වූ සැප්තැම්බර් මස පළමුවන දින රැස්වීම සඳහා කැඳවන බව ;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගන්නා දිනය වශයෙන් වර්ෂ දෙදහස් පහළොවක් වූ අගෝස්තු මස දහහත් වන දිනය නියම කරන බව ;

(ඇ) තේරීම් භාර නිලධරයන් විසින් නාමයෝජනා පත්‍ර භාර ගතයුතු වන්නේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ නාමයෝජනා කාලසීමාව වශයෙන් වර්ෂ දෙදහස් පහළොවක් වූ ජූලි මස හය වන දිනයෙන් ආරම්භව වර්ෂ දෙදහස් පහළොවක් වූ ජූලි මස දහතුන් වන දින දහවල් දොළහට අවසන් වන කාලසීමාව නියම කරන බව ; සහ

(ඈ) මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් කර ඇත්තා වූ මැතිවරණ කොට්ඨාසය සඳහා තේරී පත්වීමට අපේක්ෂා කරන මන්ත්‍රී ධූරාපේක්ෂකයන්ගේ නාමයෝජනා කරනු ලැබිය යුතු එක් එක් ස්ථානය වශයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානය නියම කරන බව ;

මෙයින් සියල්ලෝම දැනගත යුතුය.

වර්ෂ දෙදහස් පහළොවක් වූ ජුනි මස විසිහය වන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

## උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මැතිවරණ කොට්ඨාසය* | *නාමයෝජනා කරනු ලැබිය යුතු ස්ථානය* |
| අංක 01 - කොළඹ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ |
| අංක 02 - ගම්පහ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ |
| අංක 03 - කළුතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර |
| අංක 04 - මහනුවර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර |
| අංක 05 - මාතලේ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ |
| අංක 06 - නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය |
| අංක 07 - ගාල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| අංක 08 - මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර |
| අංක 09 - හම්බන්තොට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට |
| අංක 10 - යාපනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය |
| අංක 11 - වන්නි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව |
| අංක 12 - මඩකලපුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව |
| අංක 13 - දිගාමඩුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර |
| අංක 14 - ත්‍රිකුණාමලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය |
| අංක 15 - කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල |
| අංක 16 - පුත්තලම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම |
| අංක 17 - අනුරාධපුරය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය |
| අංක 18 - පොළොන්නරුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව |
| අංක 19 - බදුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල |
| අංක 20 - මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල |
| අංක 21 - රත්නපුර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර |
| අංක 22 - කෑගල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.